Cambridge Assessment International Education

# Cambridge O Level

**SINHALA** **3205/02**

Paper 2 Translation and Reading Comprehension **May/June 2023**

INSERT **1 hour 30 minutes**

**INFORMATION**
- This insert contains the reading passage.
- You may annotate this insert and use the blank spaces for planning. **Do not write your answers** on the insert.

This document has **2** pages.


© UCLES 2023

Read the following passage carefully and then answer, briefly and in **Sinhala**, **Questions 3–13** on the Question Paper.

අන්තර්ජාලය තුලින් බඩු භාණ්ඩ මිල දී ගැනීම ඉතා ජනප්‍රිය වෙමින් පවතින්නේ එය ඉතා පහසු නිසාය. පාරිභෝගිකයන්ට කඩ සාප්පු වෙත යාමට ගතවන කාලය ඉතිරි වන අතරම ඒ වෙනුවෙන් දරන්නට සිදුවන වෙහෙස ද අඩු වේ. මේ ඉතිරිවන කාලය පාරිභෝගිකයන්ට වෙනත් ප්‍රයෝජනවත් දෙයක් සඳහා හෝ විවේකය සඳහා යෙදවීමට හැකිය. කාලය සමග සටන් කරමින් මිනිසුන් එදිනෙදා කරන ජීවන අරගලය තුල මේ අන්දමට හෝ ඉඩක් ලැබීම සහනයක් ලෙස සමහරු සිතති.

අන්තර්ජාලයෙන් භාණ්ඩ මිල දී ගැනීමට නොව, තමන්ම කඩ සාප්පුවලට ගොස් භාණ්ඩ මිල දී ගැනීමට කැමැති පිරිසක් ද සිටිති. ඔවුන් ගේ මතය වන්නේ තමන් මිල දී ගන්නා දෙය පරීක්ෂාකොට බලා මිල දී ගැනීම සුදුසුවන බවයි. භාණ්ඩ පිළිබඳඇති විස්තර මෙන්ම වෙනත් අයගේ රුචි අරුචිකම් මත තබා ඇති සටහන් කියවා කරන මිල දී ගැනීම් ඔවුහු ප්‍රතික්ෂේප කරති. එමෙන්ම එසේ තමන් සාප්පු සවාරි යෑමෙන් ලැබෙන සතුට ඔවුහු ප්‍රිය කරති.

කෙසේ වුවත් යම් රෝග වසංගතයක් හෝ වෙනත් සමාජ ව්‍යසනකාරී අවස්ථාවක් වැනි තත්ත්වයන්හි දී මෙවැනි දුරස්ථ මිලදී ගැනීම් ප්‍රමාණාත්මකව ඉහල යා හැකිය. එමගින් සමාජීය වශයෙන් පුද්ගලයන් ඒකරාශිවීම සීමා වේ. එය පොදුවේ සැමටම සෞඛ්‍යමය වශයෙන් ආරක්ෂාකාරිය. ලෙඩ රෝග පැතිරීම එයින් අඩු වේ.

අන්තර්ජාලය තුලින් කෙරෙන වෙළඳාම් ඉහල යාම නිසා ඇති වී තිබෙන නරකම ප්‍රපීපලය නම් බොහෝ කඩ සාප්පු වැසී යාමයි. පාරිභෝගිකයන් අඩුකම නිසා සාප්පුවල එදිනෙදා වෙළඳ කටයුතු ප්‍රතිඵල බැස ඇත. වෙළඳසැල් පවත්වාගෙනයාම මෙන්ම සේවක වැටුප් ගෙවීම ද අසීරු වීම නිසා සේවකයින් අඩු කිරීම මුලින් සිදු වූ අතර, පසුව ඔවුන්ගේ රැකීරක්ෂා පවා අහිමි වීම සිදු වී ඇත.

තවද, ව්‍යාපාරිකයන්හට මේ සියලු හේතු අනුව පෙනී ගොස් ඇත්තේ කඩ සාප්පු පවත්වාගෙන යාමට වඩා අන්තර්ජාල වෙළඳාම් කිරීම ලාභදායක බවයි. ඒ සඳහා ඔවුන්ට අවශ්‍යවන්නේ පරිගණක ප්‍රවීණත්වය සහ තම භාණ්ඩ ගබඩා කිරීම සහ බෙදා හැරීම සඳහා පිළියෙළ කිරීමට ඉඩකඩ පමණකි. අධික කුලී අයකරන නගරබද පෙදෙස්වලට වඩා මේ කටයුතු නගරයෙන් ඈත ස්ථානයක හෝ තම නිවෙස්වලම කල හැකි බව ඔවුන්ගේ හැඟීමයි.

Permission to reproduce items where third-party owned material protected by copyright is included has been sought and cleared where possible. Every reasonable effort has been made by the publisher (UCLES) to trace copyright holders, but if any items requiring clearance have unwittingly been included, the publisher will be pleased to make amends at the earliest possible opportunity.

To avoid the issue of disclosure of answer-related information to candidates, all copyright acknowledgements are reproduced online in the Cambridge Assessment International Education Copyright Acknowledgements Booklet. This is produced for each series of examinations and is freely available to download at www.cambridgeinternational.org after the live examination series.

Cambridge Assessment International Education is part of Cambridge Assessment. Cambridge Assessment is the brand name of the University of Cambridge Local Examinations Syndicate (UCLES), which is a department of the University of Cambridge.